# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

2017 ජූලි මස 18 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර /vi(1)/17/65)

(අ) ප්‍රවාහන අධිකාරියේ හෝමාගම ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

2. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර /vi(1)/17/66 )

(අ) ප්‍රවාහන අධිකාරියේ රත්මලාන ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

3. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/ 17/67 )

(අ) ප්‍රවාහන අධිකාරියේ කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පූරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටි සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු ව බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතු පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වැ වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයට ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහප සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපා නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් භ ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(පු /vi(1)/ 17/68 )

(අ) 2015 සිට 2017 ජූනි 06 දක්වා කඩුවෙල මහ නගර සභාව විසින් කරන ලද මාර් සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

i. ව්‍යාපෘතියේ නම
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය
iii. ඇස්තමේන්තු මුදල
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කලේ ටෙන්ඩර් මඟින් ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
vii. වැඩ පටන්ගත් දිනය
viii. වැඩ අවසන් කළ දිනය
ix. ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුල මහ නගර සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඇ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

5. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර /vi(1)/ 17/69 )

(අ) **2015** සිට **2017** ජුනි **06** දක්වා හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

- **i.** ව්‍යාපෘතියේ නම
- **ii.** ප්‍රතිපාදන මූලාශ්‍රය
- **iii.** ඇස්තමේන්තු මුදල
- **iv.** ව්‍යාපෘතිය ප්‍රදානය කලේ ටෙන්ඩර් මගින් ද වෙනස් ක්‍රමයක් මගින්ද යන වග
- **v.** අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල
- **vi.** ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
- **vii.** වැඩ පටන්ගත් දිනය
- **viii.** වැඩ අවසන් කළ දිනය
- **ix.** ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුල ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද?යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඈ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

6. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පෑ පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පා හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ප්‍ර/vi(1)/ 17/

(අ) 2015 සිට 2017 ජුනි 30 දක්වා මීරිගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලද මාර්ග සං ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති (ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩස විමධ්‍යගත, පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ අනෙකුත්)

- i. ව්‍යාපෘතියේ නම
- ii. ප්‍රතිපාදන මූලාශ්‍රය
- iii. ඇස්තමේන්තු මුදල
- iv. ව්‍යාපෘතිය ප්‍රදානය කලේ ටෙන්ඩර් මගින් ද වෙනත් ක්‍රමයක් මගින්ද යන වග
- v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වු මුදල
- vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
- vii. වැඩ පටන්ගත් දිනය
- viii. වැඩ අවසන් කළ දිනය
- ix. ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය
- x. ගෙවීම් නොකර ඇති ව්‍යාපෘති ගණන
- xi. 2017/06/30 වනවිට අතරුදවුම් ගණන
- xii. 2016 වර්ෂයේ වැඩවල නොගෙවා ඇති ව්‍යාපෘති
- xiii. එසේ නොගෙවීමට හේතු

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

7. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළ පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පා හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ප්‍ර/vi(1)/ 17/

(අ) මීරිගම නාගරික සීමාව තුළ අනවසර ගොඩනැගිලි ඉදිකර තිබේද?

(ආ) එසේනම් ඒවායේ ලේඛනයක් විස්තර සහිතව ඉදිරිපත් කරන්නේද?

(ඇ) අනුමැතියකින් තොරව ඉදිකිරීම් සිදුකර ඇත්නම් ඒ සම්බන්ධයෙන් මීරිගම ප්‍රා සභාව දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

(ඈ) එක් එක් අනවසර ඉදිකිරීම්වලට ගත් නීතිමය පියවර වෙන වෙනම ඉදිරිපත් කළ හැ

(ඉ) මෙම ඉදිකිරීම්වලින් මුදල් අයකර ගන්නවාද?

(ඊ) මෙම ඉදිකිරීම්වලට විදුලිය දී ඇත්තේ කාගේ අනුමැතියෙන්ද?

(උ) මේ සඳහා වගකිව යුතු පුද්ගලයින් හෝ නිලධාරීන් කවුරුන්ද?

(ඌ) ඔවුන්ට විරුද්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

(එ) අදාළ බල ප්‍රදේශයේ ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි ඉවත්කිරීමට බලයක් මීරි ප්‍රාදේශීය සභාවට නොමැතිද?

(ඒ) එසේ ඉවත්කිරීමට බලයක් මීරිගම ප්‍රාදේශීය සභාවට ඇත්නම් මීරිගම නාගරික සීමාව ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කරන්නේ කුමන දිනට ප්‍රථමයෙන්ද?

(ඔ) ප්‍රාදේශීය සභා පනතට අනුකූලව අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමට බලයක් තිබුන ද අනවසර ඉදිකිරීම් ඉවත් නොකිරීම, සම්බන්ධයෙන් අදාළ නිළධාරීන්ට නීත්‍යානුක කටයුතු කිරීමට පියවර ඔබතුමා ගන්නේද?

8. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධ හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/ 17/72

(අ) විවිධ සේවා සමුපකාර සමිතියක ඡන්දයෙන් පත්වන අධ්‍යක්ෂ මණ්ඩලයකට බලයේ සි හැක්කේ කොපමණ කාලයකටද?

(ආ) මීරිගම විවිධ සේවා සමුපාකාර සමිතියේ වසර අටක් එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් වර බලයේ සිටි බව ඔබතුමා දන්නේද?

(ඇ) මෙම සමුපාකාර සමිතියේ 2014 වර්ෂයේ මාස කිහිපයක කොමසාරිස් පාලනය,

සභාපතිධූරයේ සිටියදී ග්‍රාමීය බැංකුවෙහි ණය නොගෙවා කල්පසු ණයකරු 2011 සභාපතිධූරයෙන් ඉවත්කළ අලස් මහතාට, භාරදුන්නේ කුමන පෙ පදනමකින්ද?

(ඈ) එසේ පත්වූ සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් 2014-2017 කාලයේ සමිතියට වූ පාඩු වගකිව යුත්තෝ හා ඒ පිළිබඳ ගෙන තිබෙන නීතිමය පියවර මොනවාද?

(ඉ) 2014 පසු,

i. සභාපතිතුමාගේ නියමයෙන් ඔහුගේ හිතවතුන්ට සමුපකාර ඉන්ධ පිරවුම්හලෙහි මුදල්වලින් ලක්ෂ තිහකට ආසන්න මුදලක් දී සමිතියට පාඩු ක
ii. ග්‍රාමීය බැංකුවේ කෝටි විස්සක් වෙළඳ ගිවිසුමට පටහැනිව ලීසිං කොම්පැණි මුදල් තැන්පත් කිරීම.
iii. සමුපකාරය නමින් තිබූ කොකා කෝලා හා වටවල තේ ඒජන්සි සමිතියෙන් ඉ කර ඔහුගේ පෞද්ගලික නාමට පවරා ගැනීම.

වැනි අයථා වැඩවලට ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

(ඊ) දැන් පවතින කොමසාරිස් පාලනය නැවත වෙනත් පුද්ගලයන්ට පවරනවාද?

(උ) නඩු කටයුතු අවසන් වී ඇතිනම් නැවත නිලවරණයක් පවත්වන්නේ කවදාද?

9. ගරු රජිත රංගන හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ප්‍ර/vi(1)/ 17/73 )

(අ) 2007 වර්ෂයේ සිට කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල සිදු කර ඇති ඉඩම් කට්ටි කිරීම් සංඛ්‍යාව කොපමණද?

(ආ) එලෙස කට්ටි කොට විකුණන ලද ඉඩම් වල ලැයිස්තුවක් ඔබතුමා විසින් සභාගත කරන්නේද?

(ඇ) (i) එම ඉඩම් වලින් පොදු භූමි වෙන් කිරීමට නිර්දේශ කොට ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද?

(ii) ඒ මොනවාද?

(ඈ) (i) එම ඉඩම් වලින් පොදු ඉඩම් වලින් සභාවට නීත්‍යානුකූලව පවරා ගනු ලැබූ වෙන්දේසි ඉඩම් කීයක් තිබේද?

(ii) ඒ මොනවාද?

(iii) පොදු භූමි පවරා නොගත් වෙන්දේසි ඉඩම් වල ලැයිස්තුවක් ඉදිරිපත් කළ හැකිද?

(ඉ) කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල වෙන්දේසි කර විකුණුලැබූ ඉඩම් වල විකුණුම් වටිනාකමින් 1% බදු මුදල සම්පූර්ණයෙන් අය කර ගත් ඉඩම් සංඛ්‍යාව කොපමණද?

(ඊ) (i) එලෙස සභාවට අයවිය යුතු මුළු බදු වටිනාකම කොපමණද?

(ii) එම වටිනාකමින් මේ දක්වා අය කොට ගෙන ඇති බදු වටිනාකම කොපමණද?

(iii) එම පොදු ඉඩම් පවරා ගැනීමටත් බදු මුදල් අය කර ගැනීමටත් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

(උ) එලෙස සභාවට අය විය යුතු බදු මුදල් අය කර ගැනීමට කටයුතු නොකළ පාර්ශවයන් විරුද්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

10. ගරු එස්.ජේ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(ප්‍ර/vi(1)/ 17/74 )

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධසේවා සමූපකාර සමිති ඉතාම අපහසුතාවෙන් පා ලබමින් පවත්වාගෙන යන බව ඔබතුමා දන්නේද?

ආ. මෙම සමූපකාර සමිති දෙකේ පසුගිය 2012 වසරේ සිට වසර 4කට අදාලව වත්කම් ෑ බැරකම් පිළිබඳ තොරතුරු වර්ෂයෙන් වර්ෂය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

ඇ. මෙම සමුපකාර සමිතිය පසුගිය වර්ෂ 4 තුල දිගින් දිගටම අලාභ ලබමින් පවත්වාෙ යාමට හේතුව ඔබතුමා දන්නේද? දන්නේනම් පාඩු ලැබීමට හේතු මොනවාද?

ඈ. මෙම සමුපකාර සමිති දෙකෙහි සේවක සංඛ්‍යාව වෙන් වෙන්ව සඳහන් කරන්ෙ කඩුවෙල හා බත්තරමුල්ල සමිති දෙකේ ප්‍රාදේශික වෙළඳසැල් කොපමණද?එම ප්‍රාදේ වෙළඳසැල් වලින් කොපමණ ප්‍රමාණයක් බාහිර පුද්ගලයින්ට කුලියට හෝ බද්ද පදන ලබාදී තිබේද? එසේ දී තිබේනම් ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

11. ගරු එස්.ඒ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (පු/vi(1)/ 17/75 )

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධ සේවා සමුපාකාර සමිති දෙකේ සේවක පඩිනඩි ගෙවීම ප්‍රමාණවත් ආදායමක් පවතින්නේද?එසේ නැතිනම් එයට හේතු මොනවාද?

ආ. මෙම සමිතිවල පාරිභෝගික අංශයේ පමණක් වත්කම් බැරකම් කොපමණද? යන ඔබතුමා දන්නේද?ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිති දෙකේ ග්‍රාමීය බැංකු අංශයෙන් පසුගිය වසර 4 ක කාල තුල එක් එක් සමිතිය ණය ලබාගෙන තිබෙන ආකාරය ඔබතුමා දන්නේද? එය වෙ වෙන්ව සඳහන් කරන්නේද?

ඈ. එම ණය පියවීම සඳහා මෙම සමුපකාර සමිති දෙකේ අධ්‍යක්ෂ මණ්ඩල මේ වන විට ගෙ ඇති ක්‍රියා මාර්ග කවරේද?

ඉ. බත්තරමුල්ල විවිධසේවා සමුපකාර සමිතියේ අවසන් වරට ඡන්දයෙන් පත්ව සිටි සභා හා අධ්‍යක්ෂ මණ්ඩලය සිදුකර ඇති විෂමාචාරයන් හා සමිතිය වෙත සිදු කරඇති ප ඔබතුමා දන්නේද?

එම තත්ත්වයන් වෙන වෙනම පැහැදිලි කරන්නේද?

ඊ. එම අය පිළිබඳව ඔබතුමා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

උ. කඩුවෙල හා බත්තරමුල්ල විවිධසේවා සමුපකාර සමිති දෙකේ වර්තමාන අධ්‍යක මණ්ඩලය පත්කර තිබෙන්නේ කුමන පදනමකින්ද?

ඌ. මෙම සමිති දෙකේ නිල කාලයන් අවසන්ව ඇති බැවින් ඡන්ද පැවැත්වීමට කටයුතු කරන්නේද?

එ. එය කුමන කාලයේ සිදු කරන්නේද?

12. ගරු එස්.ඒ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකා සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රා සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/ 17/76)

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධසේවා සමූපකාර සමිති දෙකේ නොබෝදා පත් කරන (දින කිහිපයකට පෙර පත් කල) සභාපති පත් කලේ කුමන පදනමකින්ද?

ආ. ඔහු විදේශ සංචාර සඳහා පිටත්ව තිබේද? ඒ සඳහා කොපමණ වියදමක් දරා තිබේද? වියදම් දරා ඇත්තේ කුමන අංශ වලින්ද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිති වල පසුගිය වසර 05 ක කාලය තුල හිටපු අධ්‍ය මණ්ඩල විදේශ සංචාර කොතරම් ප්‍රමාණයක් සිදුකර තිබේද?

ඈ. ඒ සඳහා කෙතරම් වියදමක් දරා තිබේද? යන්න අදාල සංචාරය හා වියදමත් සංචා සහභාගි වූ අධ්‍යක්ෂවරයාත් ආදී නිවැරදි තොරතුරු මෙම ගරු සභාවට වෙන් වෙ ඉදිරිපත් කරන්නේද?

ඉ. බත්තරමුල්ල කඩුවෙල සමිති දෙක මෙවැනි දැවැන්ත කඩා වැටීමටකට ලක්ව ඇ අවසන් වරට ඡන්දයෙන් පත්වූ අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් ඔබතුමා පිළිගන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා

"කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ අගලවත්ත ප්‍රාදේශී ලේකම් කොට්ඨාශයේ රත්මලේ ග්‍රාම නිළධාරි වසමේ පිහිටා ඇති තඹුදොල ඇල් දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙ: අලංකාර දිය ඇල්ලකි.

මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යා යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, අදහස් කරයි."

(යෝ/vi(1)/16/04

2017.07.04 දින පැවති සභා රැස්වීමේ වැඩ කටයුතු හා සම්බන්ධිතයි.

### 02. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා

"බස්නාහිර පළාත තුළ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) වලට අමතර: විධිමත් නොවන පරිදි පවත්වා ගෙන යනු ලබන පෙර පාසැල් විධිමත් කර ලියාපදිංචි කිරීම මේ සම්බන්ධව විශේෂඥ දැනුම ඇති විධිමත් උපදේශක කමිටුවක් පත් කිරීමද, ලියාපදිංචි පෙ පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 5000/- ක දීමනාවක් ගෙවීමට සුදුසු පියවර ගැනීම මැනවැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/vi(1)/17/01

## X. සභාව කල් තැබීම

2017.07.05 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව